සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ

සීමිත තරඟ විභාගය - 2014 (2016)

පැ තුනයි

# (02) ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන පසුබිම හා ගෝලීය ප්‍රවණතා

## විභාග අපේක්ෂකයින්ට උපදෙස්

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති තිත් ඉර මත ද ලියන්න.**

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II කොටස්වලින් සමන්විත පිටු **06** කින් හා ප්‍රශ්න **40** කින් යුක්තවේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම ද II කොටසේ ප්‍රශ්න සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය පැය තුනකි.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු හෝ පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 11 | |
| 3 | 12 - 24 | |
| 4 | 25 - 32 | |
| 5 | 33 - 35 | |
| 6 | 36 - 40 | |
| **එකතුව** | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## I කොටස

- අංක **1** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. වර්ෂ 2015 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූලික සමාජ දර්ශක අතුරින් අනාගත ජාතිය ගොඩනැගීමේ කර්තව්‍යය සඳහා (Nation-building task) වඩාත්ම වැදගත් වන්නේ මින් කුමක් ද?
   (1) උපතේ දී ජීවිත අපේක්ෂාව 74.9
   (2) සාමාන්‍ය සාක්ෂරතාව 93.3%
   (3) දළ උපත් අනුපාතය ජනගහනය 1 000 කට 16.0
   (4) ජනගහන ඝනත්වය වර්ගකිලෝමීටරයට පුද්ගලයන් 334 (.........)

2. වර්තමාන ශ්‍රී ලංකාවේ ස්ත්‍රී හා පුරුෂ ජන සංඛ්‍යා ප්‍රතිශත නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇත්තේ පහත කවරක ද?
   (1) 53.8 , 46.2 (2) 52.8 , 47.2 (3) 51.8 , 48.2 (4) 50.8 , 49.2 (.........)

3. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය සඳහා ආධාර කිරීමට මෑතක දී ඉදිරිපත් වී ඇති රට කුමක් ද?
   (1) ඉන්දියාව (2) ඩෙන්මාර්කය (3) ඕස්ට්‍රේලියාව (4) නවසීලන්තය (.........)

4. ශ්‍රී ලංකාව මැලේරියා රෝගය තුරන් කළ රටක් වශයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ප්‍රකාශයට පත් කරන ලද්දේ කුමන වර්ෂයේ දී ද?
   (1) 2011 (2) 2012 (3) 2013 (4) 2014 (.........)

5. විධායක ජනාධිපති ක්‍රමයෙහි අසීමිත බලතල මෙරටට අහිතකර ප්‍රතිවිපාක ගෙනදිය හැකි බව ප්‍රථමයෙන් ම පෙන්වා දෙන ලද දේශපාලන විශාරදයා මින් කවරෙක් ද?
   (1) ආචාර්ය එන්.එම්. පෙරේරා (2) මහාචාර්ය ඒ.ජේ. විල්සන්
   (3) මහාචාර්ය එස්. යූ. කොඩිකාර (4) ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (.........)

6. යටත් විජිත යුගයේ සිට මෙරට පැවති ලංකා සිවිල් සේවය අහෝසි කරන ලද්දේ කුමන වර්ෂයේ දී ද?
   (1) 1956 (2) 1963 (3) 1965 (4) 1972 (.........)

7. ශ්‍රී ලංකාවේ පිහිටි දියඇළි පහක්, ඒවායේ උස අනුව අවරෝහණ අනුපිළිවෙළින් නිවැරදිව දක්වා ඇත්තේ පහත කවරක ද?
   (1) බඹරකන්ද, දියලුම, ලක්ෂපාන, කිරිඳි, හඳපාන්
   (2) බඹරකන්ද, ලක්ෂපාන, දියලුම, කිරිඳි, හඳපාන්
   (3) බඹරකන්ද, ලක්ෂපාන, දියලුම, හඳපාන්, කිරිඳි
   (4) බඹරකන්ද, දියලුම, හඳපාන්, ලක්ෂපාන, කිරිඳි (.........)

8. ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුරවැසියන් හට පළමුවරට ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව හිමිවූයේ මින් කුමන වර්ෂයේ පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයේ දී ද?
   (1) 1956 (2) 1960 (3) 1965 (4) 1970 (.........)

9. ශ්‍රී ලංකාවට කෝපි වගාව හඳුන්වා දෙන ලද්දේ කුමන විදේශීය ජාතිකයින් විසින් ද?
   (1) අරාබි (2) පෘතුගීසි (3) ලන්දේසි (4) ඉංග්‍රීසි (.........)

10. ඉලක්කමෙන් හෝ අකාරාදි පිළිවෙළට තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා පරිගණකයට අණදෙන යෙදුම කුමක් ද?
    (1) Spam (2) Report (3) Record (4) Sort (.........)

11. "මිනිසා ස්වෛරීව උපදී. එනමුදු හෙතෙම සෑම තැනකදීම බන්ධනවලින් බැඳී ඇත (man is born free, but everywhere he is in chains)." මෙම සුප්‍රසිද්ධ ප්‍රකාශය කරන ලද්දේ කවරෙක් ද?
    (1) කාල් මාක්ස් (2) මාටින් ලූතර් කිං
    (3) ජීන් ජේකස් රූසෝ (4) මහත්මා ගාන්ධි (.........)

2992

12. වර්තමානයේ ලෝකයේ වැඩියෙන් ම තේ නිෂ්පාදනය කරනු ලබන රටවල් පහ අවරෝහණ අනුපිළිවෙළින් දැක්වෙන්නේ පහත කවරක ද?
   (1) චීනය, ඉන්දියාව, කෙන්යාව, ශ්‍රී ලංකාව, වියට්නාමය
   (2) චීනය, ශ්‍රී ලංකාව, ඉන්දියාව, කෙන්යාව, වියට්නාමය
   (3) චීනය, ඉන්දියාව, ශ්‍රී ලංකාව, කෙන්යාව, වියට්නාමය
   (4) චීනය, කෙන්යාව, ඉන්දියාව, ශ්‍රී ලංකාව, වියට්නාමය (.........)

13. ට්‍රැෆල්ගාර් චතුරශ්‍රය පිහිටා ඇති රට කුමක් ද?
   (1) එක්සත් රාජධානිය (2) රුසියාව
   (3) ඇමෙරිකා එක්සත් ජනපදය (4) ප්‍රංශය (.........)

14. ෂයිලොක්ගේ චරිතය නිරූපණය කෙරෙන විලියම් ෂේක්ස්පියර්ගේ සුප්‍රසිද්ධ නාට්‍යය මින් කුමක් ද?
   (1) ජුලියස් සීසර් (2) හැම්ලට්
   (3) වැනීසියේ වෙළෙන්දා (4) මැක්බත් (.........)

15. කබුකි හා නෝ නාට්‍ය සම්ප්‍රදාය බිහි වූ රට මින් කුමක් ද?
   (1) චීනය (2) ජපානය (3) වියට්නාමය (4) දකුණු කොරියාව (.........)

16. සෞරග්‍රහ මණ්ඩලයේ සිසිලතම ග්‍රහයා කුමක් ද?
   (1) අඟහරු (2) සෙනසුරු (3) යුරේනස් (4) නෙප්චූන් (.........)

17. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් වන ප්‍රථම ජාත්‍යන්තර සම්මුතිය වශයෙන් සලකනු ලබන්නේ මින් කුමක් ද?
   (1) රම්සාර් සම්මුතිය (2) මොන්ට්‍රියල් ප්‍රඥප්තිය
   (3) කියෝතෝ ප්‍රඥප්තිය (4) වියානා සම්මුතිය (.........)

18. මෘදු කුසලතාවක් නොවන්නේ මින් කුමක් ද?
   (1) සන්නිවේදන කුසලතා (2) කළමනාකරණ කුසලතා
   (3) ගැටලු විසඳීමේ කුසලතා (4) නායකත්ව කුසලතා (.........)

19. මෑතකදී විද්‍යාඥයින් පිරිසක් විසින් විෂ අපද්‍රව්‍ය පිරිසිදු කිරීමට ඉවහල්වන ලෝහවර්ග අනුභව කරන පැළෑටි විශේෂයක් සොයා ගන්නා ලද රට කුමක් ද?
   (1) කාම්බෝජය (2) මියන්මාරය (3) පිලිපීනය (4) ජපානය (.........)

20. ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇති "From Third World to First" නමැති ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?
   (1) ආචාර්ය අබ්දුල් කලාම් (2) නෙල්සන් මැන්ඩෙලා
   (3) වෛද්‍ය මහතීර් මොහොමඩ් (4) ලී ක්වාන් යූ (.........)

*(ලකුණු 01 × 20 = 20 යි)*

● අංක **21** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති තිත් ඉර මත ලියන්න.

21. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ජාතික ඒකාබද්ධතාව ගොඩනැගීම සඳහා පිහිටුවා ඇති අමාත්‍යාංශය කුමක් ද?

.......................................................................................................................................

22. වර්ෂ 2016 - 2020 කාලය තුළ පරිසර හිතකාමී හරිත හපන් (Green Smart) ගම්මාන දසදහසක් තැනීම සඳහා වූ රජයේ වැඩසටහන හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

.......................................................................................................................................

23. ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සංවර්ධනය සඳහා වගකීම් දරන ප්‍රධාන රාජ්‍ය ආයතනය කුමක් ද?

.......................................................................................................................................

24. වත්මන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභා සංඛ්‍යාව කීය ද?

.......................................................................................................................................

25. ශ්‍රී ලංකාවේ ගී ගයන මසුන් සිටින්නේ යැයි සුප්‍රසිද්ධ මුහුදු ප්‍රදේශය කුමක් ද?

.......................................................................................................

26. ලෝකයේ කිලෝමීටර 11 ක් වූ ගැඹුරුතම සාගර පත්ල පිහිටි ස්ථානය කුමක් ද?

.......................................................................................................

27. වර්ෂ 2015 දී ලෝකයේ අල්ලස් හා දූෂණ අවම රට කුමක් ද?

.......................................................................................................

28. 2016 ජනවාරි මාසයේ දී ස්විට්සර්ලන්තයේ ඩාවෝස් නුවර දී පවත්වන ලද ලෝක ආර්ථික සමුළුවේ තේමාව වූයේ කුමක් ද?

.......................................................................................................

29. වර්ෂ 2016 දී මිහිමත සිටින වේගවත් ම මිනිසා කවරෙක් ද?

.......................................................................................................

30. උතුරු පළාතට අයත් පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව කීය ද?

.......................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

31. කාබනික පොහොර භාවිතය සම්බන්ධයෙන් වර්තමානයේ මෙරට ගොවි ජනතාව තුළ විශාල උනන්දුවක් හට ගෙන ඇති බව දකින්නට තිබේ.

(i) කාබනික පොහොර භාවිතයෙන් අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න.

(අ) .......................................................................................................

(ආ) .......................................................................................................

(ii) රසායනික පොහොර භාවිතයෙහි අහිසි ඵල දෙකක් දක්වන්න.

(අ) .......................................................................................................

(ආ) .......................................................................................................

(iii) කාබනික පොහොර භාවිතය මෙරට ජනතාව තුළ වඩාත් ජනප්‍රිය කිරීම සඳහා යෝජනා දෙකක් සඳහන් කරන්න.

(අ) .......................................................................................................

(ආ) .......................................................................................................

32. ශ්‍රී ලංකාවේ දිළිඳුභාවය බහුවිධ මානවලින් විමර්ශනය කළ හැකි වේ.

(i) මෙරට දිළිඳුභාවය අවම කිරීම සඳහා ආර්ථික අංශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(අ) .......................................................................................................

(ආ) .......................................................................................................

(ii) මෙරට දිළිඳුභාවය අවම කිරීම සඳහා කුසලතා සංවර්ධන අංශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(අ) .......................................................................................................

(ආ) .......................................................................................................

(iii) මෙරට දිළිඳුභාවය අවම කිරීම සඳහා අධ්‍යාපනික අංශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.

(අ) .......................................................................................................

(ආ) .......................................................................................................

[ 5 වැනි පිටුව බලන්න.

33. වර්තමාන ජන සමාජය තුළ සම්ප්‍රදාය හා නවීනත්වය අතර සට්ටනයක් නිර්මාණය වී ඇති බව යුනෙස්කෝ වාර්තාවක සඳහන් වේ.

(i) ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින පොදු වටිනාකම් දෙකක් දක්වන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

(ii) මෙරට සංවර්ධනයට බාධා පමුණුවන සම්ප්‍රදාය දෙකක් සඳහන් කරන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

(iii) ශ්‍රී ලාංකිකයකු විසින් චරිතගත කළ යුතු නවීකරණ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

34. මානව වර්ගයාගේ ප්‍රගතිය සඳහා විද්‍යාව හා තාක්ෂණය මගින් ඉටු කොට ඇති සේවය ඉමහත් ය.

(i) විද්‍යාත්මක ක්‍රමය (Scientific method) පැහැදිලි කරන ප්‍රකාශ දෙකක් දක්වන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

(ii) මෑත කාලයේ දී සොයාගත් ග්‍රැෆීන් (graphene) භාවිතයෙන් ඉටු කළ හැකි සේවා දෙකක් සඳහන් කරන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

(iii) අනාගතයේ දී විද්‍යාව හා තාක්ෂණය වඩාත් මානුෂීය කිරීම සඳහා යෝජනා දෙකක් දක්වන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

35. වත්මන්හි තිරසර සංවර්ධන සංකල්පය ඉතා වැදගත් කොට සැලකේ.

(i) තිරසර සංවර්ධන සංකල්පය පැහැදිලි කෙරෙන නිර්වචන දෙකක් දක්වන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

(ii) තිරසර සංවර්ධන සංකල්පය වැදගත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

(iii) රාජ්‍ය ආයතනයක තිරසර සංවර්ධනය සඳහා සෑම පුද්ගලයකුටම දායක විය හැකි ආකාර දෙකක් දක්වන්න.

(අ) ........................................................................................................................

(ආ) ........................................................................................................................

*(ලකුණු 06 × 5 = 30 යි)*

[ 6 වැනි පිටුව බලන්න.

## II කොටස

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, සපයනු ලබන කඩදාසිවල ලියන්න.

36. ශ්‍රී ලංකාවේ මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට පක්ෂව හෝ විපක්ෂව හෝ කරුණු හතරක් හේතු සාධක සහිතව පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

37. ජාතික සංවර්ධනය සඳහා නැනෝ තාක්ෂණය යොදාගත හැකි ක්ෂෙත්‍ර හතරක් විභාග කරන්න. *(ලකුණු 08 යි)*

38. වත්මන් ශ්‍රී ලාංකික ජන සමාජයේ බිඳවැටෙමින් පවතින සාරධර්ම යථාවත් කිරීම සඳහා ගත හැකි නිශ්චිත ඵලදායී යෝජනා හතරක් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

39. සීමාසහිත සම්පත් ඇති ලෝකයක අසීමිත සංවර්ධනයක් සිදුකළ හැකි නොවේ.
මෙම තත්ත්වය අවම කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන උපායමාර්ග හතරක් විග්‍රහ කරන්න. *(ලකුණු 08 යි)*

40. වර්තමානයේ ලෝකය උණුසුම් වීම උග්‍ර පාරිසරික අර්බුදයක් බවට පත් වී තිබේ.
මෙම සංසිද්ධිය අවම කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවට ඉටු කළ හැකි කාර්යභාරය කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත තරග විභාගය - 2014 (2016)

**(03) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය I**

පැ තුනයි

**විභාග අපේක්ෂකයින්ට උපදෙස්**

**ඉතා වැදගත් :**

**පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.**



✳ **පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

**1 2 3 4**

**ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.**

.....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ
කෙටි අත්සන

.....................................

**වැදගත් :**

✳ මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** කොටස්වලින් සමන්විත පිටු **10** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ පිළිතුරු ලිවීමට පෙර ප්‍රශ්න පත්‍රය පිටු අංක අනුව සකසා ගන්න.

✳ **I** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම මෙම පත්‍රයේ ම ද** **II** කොටසේ ප්‍රශ්න **සියල්ලට ම සපයනු ලබන කඩදාසිවල ද** පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය **පැය තුනකි.**

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ **දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.**

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස **නිල්** හෝ **කළු** පෑනෙන් පමණක් ලියන්න. **පැන්සල් පාවිච්චි නොකරන්න.**

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ **අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු, මකන දියර භාවිත කරන ලද හා පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.**

පරීක්ෂකගේ ප්‍රයෝජනය
සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 5 | |
| 3 | 6 - 10 | |
| 4 | 11 - 15 | |
| 5 | 16 - 20 | |
| 6 | 21 - 27 | |
| 7 | 28 - 35 | |
| 8 | 36 - 40 | |
| 9 | 41 - 45 | |
| 10 | 46 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

## I කොටස

● අංක **1** සිට **5** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ජාතික මාර්ග දෙපාර්තමේන්තුවේ මාර්ග නඩත්තු සහකාර තනතුර සඳහා බඳවා ගන්නා ලද නවක නිලධාරීන් සඳහා පත්වීම් ලිපි සකස් කිරීමේ දී පැනනැගුණු පරිපාලනමය ගැටලු කිහිපයක් හේතුවෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව එම පත්වීම් ලිපි නිවැරදිව සකස් කර නිකුත් කිරීමට තීරණය කෙරිණි. මෙම තත්ත්වය යටතේ නවක මාර්ග නඩත්තු සහකාරවරුන්ට පත්වීම් ලබාදීම තරමක් දුරට ප්‍රමාද වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ට අසාධාරණයක් නොවීම සඳහා නිකුත් කරනු ලබන පත්වීම් ලිපි පෙරදාතම් කර නිකුත් කරන ලෙසට බොහෝදෙනෙකුගෙන් ඉල්ලීම් ඉදිරිපත් විය.

මේ අතරතුර ජාතික මාර්ග දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද මාර්ග නඩත්තු සහකාරවරුන් දෙදෙනෙකු විසින් ඔවුන් නවක පත්වීම් ලබාදීමට පෙරාතුව නැවත සේවයෙහි පිහිටුවන ලෙසට එම දෙපාර්තමේන්තුව වෙත අභියාචනයක් ඉදිරිපත්කොට තිබිණි. මේ අවස්ථාවේදී ජාතික මාර්ග දෙපාර්තමේන්තුවේ මාර්ග නඩත්තු සහකාරවරුන්ගේ වෘත්තිය සංගමය ප්‍රකාශයක් නිකුත් කරමින් අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේ සිය නිල නාමය මාර්ග නඩත්තු නිලධාරී වශයෙන් සංශෝධනය කර දෙන ලෙසට වසර ගණනාවක සිට කරනු ලබන සංගමයේ ඉල්ලීම මෙවර නවක පත්වීම් ලබාදීමේ දී හෝ ක්‍රියාවට නංවන ලෙසයි.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. නවක මාර්ග නඩත්තු සහකාරවරුන් සඳහා නිකුත් කරනු ලබන පත්වීම් ලිපි සකස් කළ යුත්තේ ආයතන සංග්‍රහයේ,
   (1) පළමුවන පරිශිෂ්ටය යටතේ ය. (2) දෙවන පරිශිෂ්ටය යටතේ ය.
   (3) තුන්වන පරිශිෂ්ටය යටතේ ය. (4) හතරවන පරිශිෂ්ටය යටතේ ය. (.........)

2. නවක මාර්ග නඩත්තු සහකාරවරුන් සඳහා පත්වීම් ලිපි සකස් කිරීමේ දී පැනනැගුණු ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය වැඩිමනත් උපදෙස් ලබා ගත හැක්කේ,
   (1) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි. (2) ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි.
   (3) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි. (4) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි.(.........)

3. මාර්ග නඩත්තු සහකාරවරුන්ගේ නිල නාමය සංශෝධනය කළ හැක්කේ,
   (1) අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ හා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව ය.
   (2) අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව ය.
   (3) අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව ය.
   (4) ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ හා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ප්‍රකාරව ය.(.........)

4. නවක මාර්ග නඩත්තු සහකාරවරුන්ගේ පත්වීම් පෙරදාතම් කිරීම සඳහා අනුමැතිය ලබා ගත යුත්තේ,
   (1) ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි. (2) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙතිනි.
   (3) ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි. (4) කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතිනි.(.........)

5. මාර්ග නඩත්තු සහකාරවරුන් දෙදෙනා විසින් නැවත සේවයෙහි පිහිටුවීම සඳහා ඉදිරිපත් කරන ලද අභියාචනයක් විය හැක්කේ,
   (1) තනතුරින් අස්වී ගොස් සිටිය දී යළි එම තනතුරට පත්කරන ලෙසට ය.
   (2) තනතුර හැර ගොස් සිටිය දී යළි එම තනතුරට පත්කරන ලෙසට ය.
   (3) තනතුරින් විශ්‍රාම ගොස් සිටිය දී යළි එම තනතුරට පත්කරන ලෙසට ය.
   (4) තනතුර දරමින් සිටිය දී රාජ්‍ය සේවයේ ම වෙනත් තනතුරකට පත්කරන ලෙසට ය. (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

[ 3 වැනි පිටුව බලන්න.

● අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

නාගරික පහසුකම් අමාත්‍යාංශයේ සහකාර ලේකම් (ආයතන) සුනිමල් විජේසේකර මහතා විසින් තම අමාත්‍යාංශයේ නිවාඩු විෂයයට අදාළව සිදු කරන ලද ලේඛන පරීක්ෂාවක දී පහත සඳහන් කරුණු අනාවරණය කර ගත හැකි විය.

* අමාත්‍යාංශයේ අනුමත නිවාඩු රෙජිස්ටරය යාවත්කාලීන කර නොතිබීම
* කළමනාකරණ සහකාර සේවයේ නිලධාරියකු වන සිරිල් කුලතුංග මහතා දඹදිව වන්දනා චාරිකාවක් සඳහා ඉදිරිපත් කර තිබූ වැරදි නිවාඩු අයදුම් පත සම්බන්ධයෙන් එම නිලධාරියා දැනුවත් කර නොතිබීම
* සංවර්ධන නිලධාරිනී අයිරාංගනී සමරතුංග මහත්මිය විසින් හදිසි අනතුරකදී සිදු වූ අස්ථි බිඳීමක් හේතුවෙන් සේවයට වාර්තා කළ නොහැකි බවට වෛද්‍ය සහතිකයක් සමග නිවාඩු අයදුම් කර ඇතත් ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම
* ජ්‍යෙෂ්ඨ සැලසුම් නිලධාරි නිමල් හේවාවසම් මහතා විසින් වසා ග්‍රන්ථි ආශ්‍රිත පිළිකා රෝගයකට ගොදුරුව ප්‍රතිකාර ගන්නා බව දැනුම් දෙමින් ඊට අදාළ නිවාඩු අයදුම් කර ඇතත් මෙතෙක් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබීම

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

6. නාගරික පහසුකම් අමාත්‍යාංශයේ අනුමත නිවාඩු රෙජිස්ටරය පවත්වාගෙන යා යුත්තේ,
   (1) පොදු 190 ආකෘතියට අනුකූලව ය.
   (2) පොදු 192 ආකෘතියට අනුකූලව ය.
   (3) පොදු 194 ආකෘතියට අනුකූලව ය.
   (4) පොදු 196 ආකෘතියට අනුකූලව ය. (.........)

7. සිරිල් කුලතුංග මහතාගේ වැරදි නිවාඩු අයදුම් පත වෙනුවට ඉදිරිපත් කළ යුතු නිවැරදි අයදුම්පත වන්නේ,
   (1) නිවාඩු 123 පොදු ආකෘති පත්‍රයයි.
   (2) නිවාඩු 124 පොදු ආකෘති පත්‍රයයි.
   (3) නිවාඩු 125 පොදු ආකෘති පත්‍රයයි.
   (4) නිවාඩු 126 පොදු ආකෘති පත්‍රයයි. (.........)

8. අයිරාංගනී සමරතුංග මහත්මිය විසින් ඉල්ලුම් කර ඇති නිවාඩු අනුමත කිරීම සඳහා වෛද්‍ය සහතිකය ඉදිරිපත්කොට තිබිය යුත්තේ,
   (1) වෛද්‍ය 169 හෝ ආයුර්වේද 43 ආකෘතියට අනුව ය.
   (2) වෛද්‍ය 170 හෝ ආයුර්වේද 44 ආකෘතියට අනුව ය.
   (3) වෛද්‍ය 172 හෝ ආයුර්වේද 46 ආකෘතියට අනුව ය.
   (4) වෛද්‍ය 173 හෝ ආයුර්වේද 47 ආකෘතියට අනුව ය. (.........)

9. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව නිමල් හේවාවසම් මහතාට ලබාදිය හැකි නිවාඩු වර්ගයකි,
   (1) අනිවාර්ය නිවාඩු. (2) විශේෂ නිවාඩු.
   (3) පඩි රහිත විශේෂ නිවාඩු. (4) සම්පූර්ණ පඩි සහිත විශේෂ නිවාඩු. (.........)

10. නිමල් හේවාවසම් මහතාට ලබාදිය හැකි නිවාඩුවේ දී එක් වරකදී අනුමත කළ හැකි නිවාඩු කාල සීමාව,
   (1) මාස 22 කට නොවැඩි කාලයකි. (2) මාස 06 කට නොවැඩි කාලයකි.
   (3) මාස 04 කට නොවැඩි කාලයකි. (4) මාස 02 කට නොවැඩි කාලයකි. (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

දීපව්‍යාප්ත සංවර්ධන නිලධාරි සේවයේ වැටුප් ප්‍රතිශෝධනය කිරීමට රජය මගින් ගනුලැබූ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සංවර්ධන නිලධාරින් සඳහා නව වැටුප් පරිමාණයක් හඳුන්වාදුන් අතර ඊට අනුරූපව සියලුම නිලධාරින් අවසන් වරට ලබාගත් වැටුප පදනම් කර ගනිමින් ඔවුන්ගේ වැටුප් ප්‍රතිශෝධනය කරන ලදී. සංවර්ධන නිලධාරියකු වන කිත්සිරි පෙරේරා මහතාගේ වැටුප ද මෙම නව වැටුප් පරිමාණයට අනුව ප්‍රතිශෝධනය කෙරිණි.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

11. සංවර්ධන නිලධාරින්ගේ වැටුප් ප්‍රතිශෝධනයට අනුව කිත්සිරි පෙරේරා මහතාගේ ප්‍රතිශෝධිත වැටුප් පරිවර්තනය කිරීම කළ යුත්තේ,

(1) වැටුප් ප්‍රතිශෝධනය ගෙවනු ලබන බලධාරියා විසින් නියම කරනු ලබන දිනයක සිට ය.

(2) වැටුප් ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කරනු ලබන දිනයේ සිට ය.

(3) වැටුප් ප්‍රතිශෝධනය සිදු කරන වසරේ ජනවාරි මස පළමුවන දා සිට ය.

(4) වැටුප් ප්‍රතිශෝධනය අනුමත කළ පසු එළැඹෙන ඊළඟ මාසයේ සිට ය. (.........)

12. වැටුප් ප්‍රතිශෝධනයට අනුව කිත්සිරි පෙරේරා මහතා අවසන් වරට ලබාගත් වැටුප නව වැටුප් පරිමාණයේ කිසියම් වැටුප් පියවරකට අනුරූපී වුවහොත් ඔහුගේ වැටුප නව වැටුප් පරිමාණයේ,

(1) ආරම්භක පියවරෙහි පිහිටුවිය යුතු වේ.

(2) අනුරූපී පියවරෙහි පිහිටුවිය යුතු වේ.

(3) අනුරූපී පියවරට ආසන්න ඊළඟ පියවරෙහි පිහිටුවිය යුතු වේ.

(4) අවසාන පියවරෙහි පිහිටුවිය යුතු වේ. (.........)

13. වැටුප් ප්‍රතිශෝධනයෙන් පසු කිත්සිරි පෙරේරා මහතාගේ ඉදිරි වැටුප් වර්ධක දිනය ලෙස සලකනු ලබන්නේ,

(1) වැටුප් ප්‍රතිශෝධනයට අදාළ වසරේ ජනවාරි පළමුවන දා ය.

(2) මුල් පත්වීම ලබාගත් දිනයයි.

(3) වැටුප් ප්‍රතිශෝධනය ක්‍රියාත්මක වන දිනයයි.

(4) ප්‍රතිශෝධිත වැටුප පළමුවරට ගෙවනු ලබන දිනයයි. (.........)

14. වැටුප් ප්‍රතිශෝධනයට අනුව කිත්සිරි පෙරේරා මහතා අවසන් වරට ලැබූ වැටුප නව වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපට වඩා අඩු වුවහොත් ඔහුගේ වැටුප නව වැටුප් පරිමාණයේ,

(1) ආරම්භක පියවරෙහි පිහිටුවිය යුතු වේ. (2) දෙවන පියවරෙහි පිහිටුවිය යුතු වේ.

(3) සිව්වන පියවරෙහි පිහිටුවිය යුතු වේ. (4) අවසාන පියවරෙහි පිහිටුවිය යුතු වේ. (.........)

15. වැටුප් ප්‍රතිශෝධනයට අනුව කිත්සිරි පෙරේරා මහතා අවසන් වරට ලබාගත් වැටුප ලෙස සලකනු ලබන්නේ, එම වැටුප් ප්‍රතිශෝධනය

(1) නිවේදනය කරන අවස්ථාවේ ලබමින් සිටි වැටුපයි.

(2) ක්‍රියාත්මක වන දිනයට පූර්වාසන්න දිනයේ ලබමින් සිටි වැටුපයි.

(3) ගෙවනු ලබන දිනයට පූර්වාසන්න දිනයේ ලබමින් සිටි වැටුපයි.

(4) ක්‍රියාත්මක වන දිනයට අදාළ වසරේ ජනවාරි 31 වන දිනට ලබමින් සිටි වැටුපයි. (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

[ 5 වැනි පිටුව බලන්න.

විභාග අංකය :......................

2992

● අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

දේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු පිළිබඳව එම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් කරන ලද විශේෂ විගණන පරීක්ෂණයක දී නිරීක්ෂණය වූයේ, ඒවා බොහොමයක නැතිවීම් හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදුකර නොමැති බවයි. මුදල් රෙගුලාසි පිළිබඳව අදාළ නිලධාරීන් තුළ පවතින අල්ප දැනුමත්, අනවධානයත් මෙම තත්ත්වයට හේතුවී ඇති බව විගණන නිලධාරීන් විසින් සිය වාර්තාවෙන් පෙන්වා දී තිබිණි. මෙම තත්ත්වය මත නැතිවීම් හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව ගත යුතු පියවර සිහිපත් කරමින් උපදේශාත්මක ලිපියක් අමාත්‍යාංශය යටතේ ඇති සියලුම ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පියවර ගනු ලැබිණි.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

16. දේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කර නොමැති ගණයක් විය හැක්කේ,
   (1) රජයේ ස්ථාවර වත්කම්වල ක්ෂයවීම් ය.
   (2) රජයේ වාණිජ ව්‍යාපාරවල පිළිඹිබු වන වසර අවසාන වෙළෙඳ පාඩු ය.
   (3) වැව්කණ්ඩි, බෝක්කු, පාලම් යනාදියට ගංවතුරින් සිදුවන හානි ය.
   (4) රජයේ දේපළක් නොවුවත් රජයේ බාරයේ තිබෙන මූල්‍ය වටිනාකමක් ඇති දේපළ නැතිවීම් ය. (.........)

17. දේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයකට නැතිවීම් හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කිරීමට සිදු වී ඇත්නම්, එසේ විය හැක්කේ හානිය සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට,
   (1) දින එකකට වඩා ප්‍රමාද වන්නේ නම් පමණි.
   (2) දින දෙකකට වඩා ප්‍රමාද වන්නේ නම් පමණි.
   (3) දින පහකට වඩා ප්‍රමාද වන්නේ නම් පමණි.
   (4) දින හතකට වඩා ප්‍රමාද වන්නේ නම් පමණි. (.........)

18. දේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක සිදු වී ඇති අලාභහානියක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ එම අලාභහානිය සිදුවී,
   (1) තුන් මසක් ඇතුළත ය. (2) හය මසක් ඇතුළත ය.
   (3) මාස නවයක් ඇතුළත ය. (4) වසරක් ඇතුළත ය. (.........)

19. මු.රෙ. 108 ප්‍රකාරව දේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරයා විසින් යවනු ලබන උපදේශාත්මක ලිපියේ හානි සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු බලධාරියකු ලෙස හඳුන්වා දිය හැකි නිලධාරියෙකි,
   (1) ප්‍රාදේශීය ලේකම්. (2) ප්‍රධාන ගණකාධිකාරී.
   (3) ගණන් දීමේ නිලධාරියා. (4) විගණකාධිපති. (.........)

20. දේශීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක හානි සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට අධිකාරී බලය නොමැති අවස්ථාවක දී, ඒ සඳහා හානි නියෝගය ලබාගත යුත්තේ,
   (1) අදාළ විෂයභාර අමාත්‍යවරයා වෙතිනි. (2) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙතිනි.
   (3) විගණකාධිපති වෙතිනි. (4) විගණන අධිකාරී වෙතිනි. (.........)

*(ලකුණු 01 × 5 = 05 යි)*

[ 6 වැනි පිටුව බලන්න.

● අංක **21** සිට **30** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ව්‍යාපෘති/වැඩසටහන් ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ ග්‍රාමීය සේවා දෙපාර්තමේන්තුවට ය. ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් අභිනියෝජනය කරන ලද බලය සහිත නියෝජිත බලධරයා ද වේ. 2015.01.01 දින සිට ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා වශයෙන් අභිනවයෙන් පත්ව ආ උපුල් රන්දෙනිය මහතා සිය දෙපාර්තමේන්තුවේ පරිපාලන ගැටලු පිළිබඳව අවධානය යොමු කරන ලදී. එහි දී දෙපාර්තමේන්තුමය නිලධාරීන් වශයෙන් සේවය කරන ග්‍රාමීය සේවා නිලධාරීන් හාරසියයකට වැඩි පිරිසක් විධිමත් ස්ථානමාරු ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් වසර ගණනාවක සිටම එකම සේවා ස්ථානයක සේවය කරනු ලබන බව අනාවරණය විය. මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ පරිපාලන කටයුතුවලට මෙන්ම එම නිලධාරීන්ගේ සේවා තෘප්තියට ද ගැටලු සහගත වන බැවින් 2016 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කළ හැකි වන පරිදි සියලුම ග්‍රාමීය සේවා නිලධාරීන් විධිමත් ලෙස ස්ථාන මාරු කිරීම සඳහා කාර්ය පටිපාටික රීති ප්‍රකාරව 2015 වසරේ වාර්ෂික ස්ථානමාරු කමිටුවක් පිහිටුවා ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදී.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

21. ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා විසින් සිය දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා විධිමත් ස්ථානමාරු ක්‍රමවේදයක් හඳුන්වා දීම තුළින් සපුරා ගැනීමට අපේක්ෂිත එක් අරමුණක් සඳහන් කරන්න.

.............................................................................................................................................

22. ග්‍රාමීය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථානමාරු කමිටුව මගින් ස්ථානමාරු ප්‍රතිපත්ති හා පටිපාටි සැකසීමේදී සැලකිල්ලට භාජනය කළ යුතු එක් කරුණක් සඳහන් කරන්න.

.............................................................................................................................................

23. ග්‍රාමීය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථානමාරු කමිටුව කවර දිනයට පෙර පිහිටුවිය යුතු ද?

.............................................................................................................................................

24. ස්ථානමාරු සම්බන්ධයෙන් ග්‍රාමීය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථානමාරු කමිටුවේ විෂය පථයට ඇතුළත් නොවන එක් කරුණක් සඳහන් කරන්න.

.............................................................................................................................................

25. ග්‍රාමීය සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථානමාරු කමිටුවට වෘත්තිය සමිතියක් මගින් නියෝජිතයෙක් නම් කිරීම සඳහා වාර්ෂික ස්ථානමාරු විෂයපථයට අයත්වන නිලධාරීන්ගෙන් අවම වශයෙන් කොපමණ ප්‍රතිශතයක් අදාළ වෘත්තිය සමිතිය නියෝජනය කළ යුතු ද?

.............................................................................................................................................

26. ග්‍රාමීය සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ලැබෙන වාර්ෂික ස්ථානමාරු අයදුම්පත්‍ර කවර දිනයට පෙර වාර්ෂික ස්ථානමාරු කමිටුව වෙත භාර දිය යුතු ද?

.............................................................................................................................................

27. වාර්ෂික ස්ථානමාරු කමිටුව විසින් සිය ස්ථානමාරු යෝජනා, ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුත්තේ කවර දිනයට පෙර ද?

.............................................................................................................................................

[ 7 වැනි පිටුව බලන්න.

28. වාර්ෂික ස්ථානමාරු යෝජනා ලද විගස ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා විසින් යෝජිත වාර්ෂික ස්ථානමාරු පිළිබඳ දැන්වීම නිකුත් කළ යුත්තේ කවර දිනයට පෙර ද?

.............................................................................................................................................

29. වාර්ෂික ස්ථානමාරු දැන්වීමකින් අතෘප්තියට පත් වන නිලධාරියකු විසින් ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා වෙත කරුණු ඉදිරිපත් කිරීම සිදු කළ යුත්තේ නිවාඩු දිනයන් ද ඇතුළත්ව උපරිම දින කීයක් ඇතුළත ද?

.............................................................................................................................................

30. වාර්ෂික ස්ථානමාරු දැන්වීමකින් අතෘප්තියට පත් වන නිලධාරියකු විසින් ග්‍රාමීය සේවා අධ්‍යක්ෂවරයා වෙත කරුණු දැක්වීම සිදු කළ යුත්තේ ආයතන සංග්‍රහයේ කවර පරිශිෂ්ටය ප්‍රකාරව ද?

.............................................................................................................................................

*(ලකුණු 01 × 10 = 10 යි)*

- අංක **31** සිට **35** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

| |
|---|
| වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය රජයේ මුදල් රෙගුලාසි මගින් පැහැදිලි කර ඇත. ඒ අනුව සෑම රජයේ අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් මගින්ම ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ආදායම් හා වියදම් කෙටුම්පත් ඇස්තමේන්තු සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. |

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත් ඉර** මත කෙටියෙන් ලියන්න.

31. රජයේ වියදම් වර්ග කරනු ලබන ප්‍රධාන කොටස් දෙක මොනවා ද?

(i) .............................................................................................................................

(ii) .............................................................................................................................

32. අත්තිකාරම් ගිණුම් වර්ග දෙකක් දක්වන්න.

(i) .............................................................................................................................

(ii) .............................................................................................................................

33. අත්තිකාරම් ගිණුම්වලට අදාළ ඇස්තමේන්තුවල සීමා දෙකක් දක්වන්න.

(i) .............................................................................................................................

(ii) .............................................................................................................................

34. අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු හැරුණුකොට ඉදිරි මුදල් වර්ෂය සඳහා රජයේ අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් මගින් සකස් කරනු ලබන ආදායම් හා වියදම් ඇස්තමේන්තුවලට ඇතුළත් කරනු ලබන වෙනත් ඇස්තමේන්තු වර්ග දෙකක් දක්වන්න.

(i) .............................................................................................................................

(ii) .............................................................................................................................

35. (i) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් පසු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන කෙටුම්පත් ඇස්තමේන්තු හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

.............................................................................................................................

(ii) එම කෙටුම්පත් නීතියක් බවට පත්වීම සඳහා කථානායකවරයා විසින් අත්සන යෙදූ පසු හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

.............................................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

පළාත් පාලන මැතිවරණය සඳහා නාමයෝජනා ලබාගෙන දින නියම කර ඇති කාලසීමාවකි. මෙම කාලසීමාව තුළ දී දිසා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලද පැමිණිල්ලකින් කියැවුණේ, දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකමක් නොමැති අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් කිහිපදෙනෙකු ඡන්ද අපේක්ෂකයින් ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත වන බව ය. එසේම එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක සේවය කරන දේශපාලන අයිතිවාසිකම් භුක්තිවිඳීමට හිමිකමක් ඇති ක්ෂේත්‍ර නිලධාරීන් කිහිපදෙනෙකු එම අයිතිවාසිකම් භුක්තිවිඳීමේ දී පිළිපැදිය යුතු කොන්දේසි කඩකරමින් කටයුතු කරන බවත් පැමිණිල්ලෙන් වැඩිදුරටත් කියැවිණි. මේ අතර රජයේ ලියාපදිංචි වෘත්තිය සංගමයක් වන දිසා සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තිය සංගමයේ සාමාජිකයින් 3425 ක් සිටින බැවින් එම සංගමයේ ප්‍රධාන ලේකම්වරයා වන පැට්‍රික් පුංචිහේවා මහතා පූර්ණ කාලීනව සංගමයේ කටයුතු සඳහා නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් ද දිසා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් විය.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර, දී ඇති තිත් ඉර මත කෙටියෙන් ලියන්න.

36. දිසා සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තීය සංගමයේ සාමාජික සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, එම වෘත්තීය සංගමයේ කටයුතු සඳහා පූර්ණකාලීනව නිලධාරියකු මුදාහැරිය හැකි අවස්ථා දෙකක් දක්වන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

37. පැට්‍රික් පුංචිහේවා මහතා පූර්ණ කාලීනව වෘත්තීය සමිතියේ කටයුතු සඳහා නිදහස් කරන්නේ නම්, එම නිලධාරියාගේ වැටුප් ගෙවීමට අදාළ ආයතන සංග්‍රහයේ විධිවිධාන දෙකක් සඳහන් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

38. දිසා සංවර්ධන නිලධාරීන්ගේ සංගමයේ නිලධාරීන් මාරුකිරීමේ දී ආයතන සංග්‍රහයේ ස්ථාපිත අනුග්‍රහය ලබා ගැනීම සඳහා එම සංගමය විසින් නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ඉල්ලුම්පත්‍රයේ සඳහන් විය යුතු කරුණු දෙකක් දක්වන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

39. දේශපාලන අයිතිවාසිකම් භුක්තිවිඳීමට හිමිකම් නොමැති නිලධාරියකුට තහනම් කටයුතු දෙකක් සඳහන් කරන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

40. දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරියකු එම අයිතිවාසිකම් භුක්තිවිඳීමේ දී පිළිපැදිය යුතු කොන්දේසි දෙකක් දක්වන්න.

(i) ..........................................................................................

(ii) ..........................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

[ 9 වැනි පිටුව බලන්න.

● අංක **41** සිට **45** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

ජීව දත්ත දෙපාර්තමේන්තුවේ නව අධ්‍යක්ෂවරයා වශයෙන් පත්වූ ලලිත් වනිගරත්න මහතා සිය තනතුරේ වැඩ භාර ගැනීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවේ සියලුම අංශ පිළිබඳව විගණනයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස සිය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක වෙත පවරන ලදී. ඒ අනුව අදාළ අංශවල විගණන පරීක්ෂණ සිදුකර අභ්‍යන්තර විගණක විසින් ලලිත් වනිගරත්න මහතා වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවෙන් පහත සඳහන් පරිපාලන දෝෂ අධ්‍යක්ෂවරයාගේ අවධානයට ලක් කර තිබුණි.

- ✳ ගෙවීම් කිරීමේ දී නිශ්චිත පොදු ආකෘති පත්‍ර භාවිත කර නොතිබීම
- ✳ විශේෂ අවස්ථා සඳහා ගෙවීම් කිරීමේ දී ලබාගත යුතු ජීවිත සහතික ලබා නොගෙන ගෙවීම් සිදුකර තිබීම
- ✳ රාජකාරි ලිපි ගනුදෙනුවල දී නිශ්චිත නියම නොසලකා කටයුතු කිරීම
- ✳ දෙපාර්තමේන්තුවේ මහජනතාව සමග නිරන්තරයෙන් ගනුදෙනු කරන නිලධාරීන් 'සාමාන්‍ය හැසිරීම' නොසලකා කටයුතු කිරීම
- ✳ ජීව දත්ත සහතික නිකුත් කිරීම සඳහා මහජනතාවගෙන් ලබාගත් මුදල් සරප්වරයා විසින් පෞද්ගලික කාර්යන් සඳහා යොදා ගැනීම

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි **පිළිතුර**, දී ඇති **තිත් ඉර** මත කෙටියෙන් ලියන්න.

41. ජීව දත්ත දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ගෙවීම් කිරීම සඳහා භාවිත කළ යුතු පොදු ආකෘති පත්‍ර අංකය දක්වන්න.

    (i) තැපැල්පතුවලින් කෙරෙන ගෙවීම් :........................................

    (ii) අතිකාල ගෙවීම් :........................................

42. ජීව දත්ත දෙපාර්තමේන්තුව මගින් මු.රෙ. 290 ට අනුකූලව ගෙවීමක් සිදුකිරීමට පෙර ජීවත්වන බවට සහතිකයක් ලබා ගත යුතු අවස්ථා දෙකක් දක්වන්න.

    (i) ........................................

    (ii) ........................................

43. ජීව දත්ත දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාජකාරි ලිපි ගනුදෙනුවල දී පිළිපැදිය යුතු නියම දෙකක් සඳහන් කරන්න.

    (i) ........................................

    (ii) ........................................

44. ජීව දත්ත දෙපාර්තමේන්තුවේ මහජනතාව සමග නිරන්තරයෙන් ගනුදෙනු කරන රජයේ නිලධාරියකු සාමාන්‍ය හැසිරීම යටතේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු දෙකක් දක්වන්න.

    (i) ........................................

    (ii) ........................................

45. ජීව දත්ත සහතික නිකුත් කිරීම සඳහා මහජනතාවගෙන් ලබාගත් මුදල්, සරප්වරයා විසින් පෞද්ගලික කාර්යන් සඳහා භාවිත කිරීම සම්බන්ධයෙන් අදාළ කරගත හැකි ආයතන සංග්‍රහයේ විධිවිධාන දෙකක් දක්වන්න.

    (i) ........................................

    (ii) ........................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

[ 10 වැනි පිටුව බලන්න.

## II කොටස

- අංක **46** සිට **50** තෙක් ප්‍රශ්න, පහත සඳහන් සිද්ධිය / අවස්ථාව මත පදනම් වේ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් පරිසර සුරැකුම් අමාත්‍යාංශය සම්බන්ධයෙන් කරන ලද විගණන පරීක්ෂණයකින් එම අමාත්‍යාංශයේ ගබඩාව තුළ කාලයක සිට සිදුව ඇති විෂමාචාර ක්‍රියා කිහිපයක්ම අනාවරණය කර ගැනීමට හැකිවිය. ගබඩාවේ බඩු අස්ථානගතවීම්, තොග පොත තුලනය නොවීම, ගබඩා ලේඛන නිසි පරිදි පවත්වාගෙන නොයාම හා එම ලේඛන යාවත්කාලීන නොකිරීම මෙම විගණන පරීක්ෂණයේ දී පැහැදිලිවම නිරීක්ෂණය වී ඇත. ඒ අනුව ගබඩාවේ සිදුව ඇති මෙම විෂමාචාර සඳහන් කරමින් විගණන අධිකාරිවරයා විසින් පරිසර සුරැකුම් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කඩිනමින් විගණන වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

මෙම සිද්ධියට / අවස්ථාවට අනුව පහත එක් එක් ප්‍රශ්නයට සපයනු ලබන කඩදාසිවල පිළිතුරු ලියන්න.

46. පරිසර සුරැකුම් අමාත්‍යාංශය පිළිබඳව විගණන අධිකාරිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව මගින් අනාවරණය වන විෂමාචාර සම්බන්ධයෙන් විනය බලධාරියා වශයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා ගත යුතු පියවර කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

47. පරිසර සුරැකුම් අමාත්‍යාංශයේ ගබඩාවේ සිදුව ඇති හානිවීම් / පාඩුවීම් සම්බන්ධයෙන් මු.රෙ. 104 (4) යටතේ පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීමට එම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (පාලන) වෙත පවරයි. එම සහකාර අධ්‍යක්ෂ (පාලන) ඔබ යැයි උපකල්පනය කර පරීක්ෂණයෙන් අනතුරුව ඔබගේ පූර්ණ වාර්තාවට මු.රෙ. 104 (4) යටතේ ඇතුළත් විය යුතු කරුණු මොනවා දැයි සඳහන් කරන්න. *(ලකුණු 08 යි)*

48. මූලික විමර්ශනයකින් පසු පරිසර සුරැකුම් අමාත්‍යාංශයේ ගබඩා භාරකරුට එරෙහිව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයේ දී පැමිණිල්ල මෙහෙයවීමේ වගකීම සහකාර අධ්‍යක්ෂක (ආයතන) වෙත පවරන ලදී. ඒ අනුව පැමිණිල්ල මෙහෙයවන නිලධාරී වශයෙන් සහකාර අධ්‍යක්ෂක (ආයතන) ගේ වගකීම් හා කාර්යභාරය පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

49. විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව ගබඩා භාරකරු වෙත නිකුත් කරනු ලබන විනය නියෝගයක අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු කරුණු මොනවා ද? *(ලකුණු 08 යි)*

50. විනය නියෝගය සම්බන්ධයෙන් ගබඩා භාරකරු විසින් අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, ඒ සඳහා ආයතන සංග්‍රහයේ ඇතුළත් විධිවිධාන කවරේ දැයි පැහැදිලි කරන්න. *(ලකුණු 08 යි)*

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ
සීමිත තරග විභාගය - 2014 (2016)

**(04) රාජ්‍ය පරිපාලනමය විෂයානුබද්ධ අධ්‍යයනය II**

පැ තුනයි

| ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 (i) | |
| 4 (ii) | |
| 4 (iii) | |
| එකතුව | |
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

**විභාග අංකය :** ..........................

**1.** පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන විශ්ලේෂණාත්මකව හා තර්කානුකූලව කරුණු ඉදිරිපත් කරමින් වචන සංඛ්‍යාව **250-300** අතර වන සේ වාක්‍ය රචනයක් ලියන්න.

(i) රටක දේශපාලන ක්ෂේත්‍රයෙහි හා පාලන තන්ත්‍රයෙහි සිදුවන නවීකරණවලට අනුරූප වන ආකාරයෙන් හැඩ ගැසීමේ දී පරිපාලන නිලධාරියාට මුහුණ පෑමට සිදු විය හැකි අභියෝග ජයගැනීම

(ii) ලොව පුරා ව්‍යාප්ත වන ත්‍රස්තවාදී ව්‍යාපාර නිසා දෛනිකව ඉහළ යන මනුෂ්‍ය ඝාතන නවතාලීම

(iii) රටක රාජ්‍ය අධීක්ෂණය යටතේ පවත්නා අධ්‍යාපනය පෞද්ගලිකකරණයට හා ජාත්‍යන්තරකරණයට යොමු වීමේ දී එහි ප්‍රමිතිය හා විශ්වසනීයත්වය පිළිබඳව මතු විය හැකි ගැටලු නිරාකරණය කර ගැනීම

(iv) සේවා වියුක්තිය හා ඌන සේවා නියුක්තිය මගින් තරුණ පරපුර අතර මතුවිය හැකි අපේක්ෂා භංගත්වය

(v) රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර පමණක් භාවිත කිරීම මගින් ගොවි ජනතාවට අත්වන ප්‍රතිලාභ

(vi) ජනවාර්ගික හා ආගමික මතවාද පදනම් කොටගත් දේශපාලන පක්ෂ නිසා රටක පොදු ජන සුභසිද්ධිය සැලසීමේ දී මතු විය හැකි දුෂ්කරතා

..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................
..............................................................................................................................

[ 2 වැනි පිටුව බලන්න.

(ලකුණු 30 යි)

[ 3 වැනි පිටුව බලන්න.

2992

**2.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. සාරාංශය අවසානයේ ඔබ ලියූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

සෞඛ්‍ය සේවා ආයතන ජාලය ව්‍යාප්ත වුව ද, විශේෂඥ රෝහල් සහ විශේෂඥ නොවන ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවල භූමිකාව පැහැදිලි ලෙස වර්ග කිරීමේ අඩුපාඩු පැවතීම, සෞඛ්‍ය සේවා පද්ධතිය වෙත සර්ව සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීමට බාධාවක් වී ඇත. කිසිදු සෞඛ්‍ය ආයතනයක හෝ කාර්යාලයක හෝ ලියාපදිංචි නොවී ඕනෑම ආයතනයකින් අවශ්‍ය සේවා ලබාගැනීමේ නිදහස, ප්‍රතිකාර සේවා ලබාගැනීමට අවශ්‍ය රෝගීන් සතුව පවතී. රෝග නිවාරණ සේවා හෝ ප්‍රජා සෞඛ්‍ය සේවා හෝ ලබාගැනීමට අවශ්‍ය රෝගීන් සම්බන්ධයෙන් මීට ප්‍රතිවිරුද්ධ තත්ත්වයක් පවතින අතර, ඔවුන් මහජන සෞඛ්‍ය විත්නඹුවන් සමග හෝ සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයෙහි හෝ ලියාපදිංචි විය යුතු ය. ප්‍රාථමික සෞඛ්‍ය සේවා නිවාරණ ආයතන මඟහැර විශේෂඥ ආයතන වෙත යාමට රෝගීන්ට ඇති හැකියාව, මෙම ආයතනවලින් අපේක්ෂා කරන සෞඛ්‍ය ප්‍රතිඵලවල කාර්යක්ෂමතාව අඩු කිරීමට හේතු වී ඇත. එම නිසා වෛද්‍ය අවධානය අඛණ්ඩව පැවතීම සහතික කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවලට පැමිණෙන රෝගීන්, විශේෂඥ රෝහල් වෙත යොමු කිරීම සහ මූලික ප්‍රතිකාරවලින් පසු රෝගීන් නැවතත් එම ආයතන වෙතට යොමු කෙරෙන පර්ෂද ක්‍රමයක් ඇති කිරීම සඳහා මූලික පියවර ගැනෙමින් පවතී. රෝග බරපතළ වූ අවස්ථාවල දී මෙන්ම සංකූලතා ඇති වූ අවස්ථාවල දී ඒවා වළක්වාලීම සඳහා නිරන්තරයෙන් කල් ඇතිව රෝග නිශ්චය කර ගැනීම සඳහා ද විශේෂඥ සේවා ලබාගැනීම පිණිස රෝගීන් යොමු කළ හැකි වනු ඇත. මෙවැනි පද්ධතියක් පැවතීම මගින් විශේෂඥ රෝහල් තුළ ඇතිවන තදබදය අඩු කෙරෙනු ඇති අතර, හදිසි වෛද්‍ය අවධානයක් අවශ්‍ය වන රෝගීන් මෙන්ම, කල් ඇතිව රෝග නිශ්චය කර ගැනීම සඳහා රෝග නිවාරණ සේවා අවශ්‍ය වන රෝගීන් ද වෙත විශේෂඥ වෛද්‍යවරුන්ගේ වැඩි අවධානය යොමු කළ හැකි වනු ඇත. එමගින් සම්පත් සඵල ලෙස භාවිත කළ හැකි වන අතර, පර්යේෂණ කටයුතු වැනි වෙනත් වැදගත් අංශ වෙත අරමුදල් යොමු කිරීම සඳහා ද හැකියාව ලැබෙනු ඇත.

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

.............................................................................................................

*(ලකුණු 25 යි)*

[ 4 වැනි පිටුව බලන්න.

**3.** පහත දැක්වෙන එක් එක් පාඨයෙහි ප්‍රධාන අදහස හැකිතාක් කෙටියෙන් එක් වාක්‍යයකින් දක්වා, තද කළු අකුරින් මුද්‍රිත යෙදුම්වලට විවරණ සපයන්න.

**(i)** හොඳ පාලන තන්ත්‍රයක් පවත්වාගෙන යාම සඳහා එකිනෙකින් වෙන් වූ ආයතන තුනක් මගින් මෙම බල තුන වෙන්ව ක්‍රියාත්මක කළ යුතු යැයි යන අදහස ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් වැනි පෞරාණික දේශපාලන චින්තකයන් විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. බලය බෙදීම ලෙස හඳුන්වනු ලබන නූතන න්‍යාය විග්‍රහ කළ ප්‍රංශ නීති ලේඛකයෙකු වූ මොන්ටෙස්කි මෙම අදහස විස්තර කර ඇත. බලය අනිසි ලෙස යොදාගැනීම වැළැක්වීම සඳහාත්, පුද්ගලයාගේ නත්වැදැරුම් නිදහස ආරක්ෂා කිරීම සඳහාත් රජයේ ප්‍රධාන බල තුන එකිනෙකින් ස්වායත්තව ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම න්‍යායයෙන් කියැවේ. මෙම බල තුනම එක් පුද්ගලයකුට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ පවරා දුනහොත්, එම බලයන් උචිත ලෙස ක්‍රියාත්මක කරන බවට වගබලාගැනීම සඳහා ක්‍රමයක් නොමැති හෙයින්, ඒකාධිපතිත්වයකට මුල පිරෙනු ඇත.

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

**(ii)** විදේශ සම්භවයක් සහිත ශ්‍රමිකයන් මෙරටට පැමිණීම ශ්‍රම වෙළෙඳපොළේ මෑතකාලීන ප්‍රවණතාවකි. මෙම තත්ත්වය ශ්‍රම වෙළෙඳපොළ තුළ වැටුප් පීඩනය ලිහිල් කිරීමට උපකාරී වන අතර, වෘත්තීය හා මනාව පුහුණු ආගමනික ශ්‍රමිකයන් මගින් දැනුම සහ තාක්ෂණය ව්‍යාප්ත කිරීමට ඉඩප්‍රස්තා සපයන සාධනීය ප්‍රවණතාවකි. කෙසේ වුව ද, මෙමගින් මතුවන අවදානම්කාරී තත්ත්වය වනුයේ, මෙම ශ්‍රම ආගමනය සේවා වියුක්තිය ඉහළ නැංවීම කෙරෙහි පීඩනයක් ඇති කළ හැකි වීමයි.

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

**(iii)** අවිආයුධ ව්‍යාප්තිය නතර කිරීම ද සියලු සමූහ ඝාතන අවි අඩුකිරීම ද කල්යාමේ දී තුරන් කිරීම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අභිමතාර්ථ වේ. නිරායුධකරණය පිණිස කතිකා කිරීම, නිර්දේශ කිරීම සහ අධ්‍යයන ඇරඹීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය අඛණ්ඩ සංසදයක් වී තිබේ. නිරායුධකරණය පිළිබඳ සම්මන්ත්‍රණයේ දී සහ වෙනත් ජාත්‍යන්තර පුද්ගල මණ්ඩලවල දී බහුපාර්ශ්වීය සාකච්ඡා සඳහා එම සංවිධානය සහයෝගය දෙයි. මෙම කතිකාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් න්‍යෂ්ටික ප්‍රගුණනය වැළැක්වීමේ සම්මුතිය, න්‍යෂ්ටික පර්යේෂණ තහනම් කිරීමේ අවබෝධාත්මක සම්මුතිය සහ න්‍යෂ්ටික ක්‍රියා මුක්ත ප්‍රදේශ පිහිටුවීමේ සම්මුතිය යන සම්මුතිවලට එළැඹීමට හැකි වී තිබේ.

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

*(ලකුණු 05 × 3 = 15 යි)*

[ 5 වැනි පිටුව බලන්න.

**4.** පහත දැක්වෙන එක් එක් පාඨය කියවා, ඒ ඇසුරින් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ස්ථිර තනතුරකට කරන සෑම පත්වීමක්ම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. යම්කිසි නිලධාරියකු පරිවාස කාලයකට යටත් කොට පත්කිරීමේ අදහස වනුයේ, ඉදින් ඔහු ස්වකීය පත්වීමේ ලිපියෙන් බැඳුණු යුතුකම් නොපිරිහෙළා ඉටු කරමින් තමාගේ හැසිරීමෙන් ද කාර්යක්ෂම ලෙස සේවය කිරීමෙන් ද තමා රාජ්‍ය සේවයෙහි රඳවා ගනු ලැබීමට සුදුස්සකු බව සනාථ කළහොත් රාජ්‍ය සේවයෙහි රඳවා ගනු ලැබීමේ බලාපොරොත්තුව, සේවයෙහි ස්ථිර කරනු ලැබීමට කලින් ඒ නිලධාරියා තුළ ඇති කරවීම ය. විෂමාචාරය නිශ්චිතව ඔප්පු කළ නොහැකි නමුත් මානසික හා වෙනත් දුර්වලතා නිසා රාජ්‍ය සේවයෙන් බැහැර කළ යුතුව තිබෙන කෙනෙකු ප්‍රමාද නොවී ඔහුට වෙනත් රැකියාවක් සොයා ගැනීමට හැකිවන පරිදි සේවයෙන් ඉවත් කිරීමට පරිවාස කාලයට යටත්ව පත් කිරීම නිසා ඉඩ සැලසේ. පරිවාස කාල සීමාව තුළ දී, ඉදින් නිලධාරියා ස්ථිර සේවයෙහි රඳවා ගැනීමේ යෝග්‍යතාව පිළිබඳ සැක ඇතිවන පරිදි ඔහු කෙරෙහි යම් යම් ගති පැවතුම් පවත්නා බව පෙනී ගියහොත් නොපමාව ඔහුට ඒ බව දන්වා අවශ්‍ය දැනමුතුකම් දී ඔහුගේ අඩුපාඩු මඟහරවා ගැනීමට හැකි සෑම ආධාරයක්ම දිය යුතුය. දිගින්දිගට කරගෙන ගියහොත් නිලධාරියා සේවයෙහි ස්ථිර කිරීම වැළකී යන අන්දමේ බරපතළ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හෝ හැසිරීමක් නොහොත් චරිතය පිළිබඳ කිසියම් දෝෂයක් හෝ ගැන නිලධාරියකුට අවවාද කරන විට එම අවවාද කිරීම ලියවිල්ලකින් කළ යුතු අතර, අවවාදය ලැබුණු බවට නිලධාරියාගෙන් අත්සන් ලබාගත යුතුය. එසේ කළ යුතු වන්නේ නිලධාරියාගේ අඩුපාඩු ගැන ඔහුට කල්තබා දැනුම් දී එම අඩුපාඩු මඟහරවා ගැනීමට ඔහුට අවස්ථාවක් දෙන ලද්දේ ද යන්න ගැන පසුව ප්‍රශ්නයක් පැන නැගීමට ඉඩක් ඇති නොවනු පිණිස ය.

(අ) මෙම පාඨයෙහි අරමුණ කුමක් ද?

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

(ආ) පරිවාස කාලය ගත කරන නිලධාරීන් පිළිබඳව සානුකම්පිත දෘෂ්ටියකින් මෙම පාඨය ඉදිරිපත් කෙරෙන බව තහවුරු වන එක් නිදසුනක් ඉදිරිපත් කරන්න.

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

(ඉ) පරිවාස කාලයකට යටත්ව පත්වීමක් ලබා දීමේ හේතු කවරේ ද?

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

(ඊ) ලියවිල්ලක් මගින් නිලධාරියකුට අවවාද කළ යුතු වන්නේ කෙබඳු අවස්ථාවක දී ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(උ) කිසියම් නිලධාරියකු රාජ්‍ය සේවයෙහි රඳවා ගනු ලැබීමට සුදුස්සකු බව සනාථ කෙරෙන පූර්ව අවශ්‍යතා කවරේ ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

(ii) වෙනස්වන ලෝකයේ ඉල්ලුම සමග සමගාමී වීමේ අරමුණින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සුවිශාල පරිවර්තනයක් සිදු වෙමින් පවතී. ඒ අනුව, භූගෝලීය වශයෙන් විසිරී ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා සේවායෝජකයන්ගේ අවශ්‍යතා සමග සමගාමී වෙමින් සාම්ප්‍රදායික මාදිලියෙන් බැහැරව නිපුණතා පාදක කරගත් අධ්‍යාපන පද්ධතියක් කරා අධ්‍යාපන ක්ෂේත්‍රය පරිවර්තනය වෙමින් සිටී. උසස් අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම සපුරාලීමට රජයට අසීරු බැවින්, උසස් අධ්‍යාපනය සඳහා වන රජයේ ඒකාධිකාරය දැඩි පීඩනයකට යටත්වීම නොවැළැක්විය හැකි වනු ඇත. තවද, සිසුන් අපේක්ෂා කරන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා විශ්වවිද්‍යාල විසින් ලබාදෙන ප්‍රමිතීන් අතර පරතරයක් නිර්මාණය වී ඇති අතර, පවතින සම්පත් භාවිතයෙන් එය අවම කිරීම අසීරු වේ. එමනිසා, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල විසින් ප්‍රදානය කරන පාඨමාලා විවිධාංගීකරණය කළ යුතු අතරම, ගෝලීය වෙළෙඳපොළ තුළ සිසුන්ට වැඩි අවස්ථා හිමිකර දීම සඳහා සිසුන් නිරාවරණය වන නිපුණතා මට්ටම් පුළුල් කිරීම ද කළ යුතුව ඇත. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ රජයේ ඒකාධිකාරය අඩු කිරීමේ අරමුණින්, අධ්‍යයන විශිෂ්ටතා වෙනුවෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශ එකිනෙකා සමග තරගකාරී ලෙස කටයුතු කරන පරිදි වඩා විධිමත් ද්වි-ස්තර පද්ධතියක් කරා ගමන් කිරීම සුදුසු වේ.

(අ) මෙම පාඨයෙහි මූලික අරමුණ දක්වන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ආ) උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව මෙහි ඉදිරිපත් කෙරෙන ද්වි-ස්තර පද්ධතිය යන්නෙන් අදහස් කෙරෙන්නේ කුමක් ද?

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

(ඉ) සිසුන් අපේක්‍ෂා කරන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා විශ්වවිද්‍යාල විසින් ලබා දෙන ප්‍රමිතීන් අතර පවත්නා පරතරය අවම කිරීමට මෙම ලේඛකයා යෝජනා කරන උපාය මාර්ගය කවරේ ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ඊ) සාම්ප්‍රදායික මාදිලියෙන් බැහැරව නිපුණතා පාදක කරගත් අධ්‍යාපන පද්ධතියක් කරා අධ්‍යාපන ක්ෂේත්‍රය පරිවර්තනය වන්නේ කවර අවශ්‍යතාවක් උදෙසා ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(උ) උසස් අධ්‍යාපනය පිළිබඳ රජයේ ඒකාධිකාරය දැඩි පීඩනයකට යටත්ව ඇතැයි මෙම ලේඛකයා පවසන්නේ ඇයි?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

*(ලකුණු 02 × 5 = 10 යි)*

(iii) 2014 වසරේ දී සහ ඉන් ඉදිරියට ශ්‍රී ලංකාවේ විදේශීය අංශය බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවමින් තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ. ගෝලීය ආර්ථිකයේ අපේක්ෂිත යථාතත්ත්වයට පත්වීම සහ දේශීය ආර්ථිකයේ ඉහළ වර්ධන අපේක්‍ෂාවන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ සුභවාදී දැක්ම තහවුරු කරයි. වෙළෙඳ භාණ්ඩ අපනයන ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ඉලක්කගත වූ ක්‍රියාමාර්ග සහ තෝරාගත් ආනයන අධෛර්යවත් කිරීම මගින් වෙළෙඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩුවනු ඇතැයි අපේක්‍ෂා කෙරේ. විශේෂයෙන්ම සංචාරක, වරාය හා ගුවන්තොටුපොළ සහ තොරතුරු තාක්‍ෂණ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රය වෙත පැවරීමේ ව්‍යාපාර යන අංශයන්හි සිදුවන විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ ලබමින් රටෙහි ආර්ථික කේන්ද්‍රස්ථානවල ඇතිවන වැඩිදියුණුවීම තුළින් සේවා අපනයන මැදිකාලීනව වැඩි වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්‍ෂා කෙරේ. සේවක සංක්‍රමණික සංයුතිය විවිධාංගීකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩිදියුණු කිරීමට හේතුවනු ඇති අතර, එම ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ශක්තිමත් විදේශ විනිමය මූලයක් ලෙස මැදි කාලීන වශයෙන් තවදුරටත් පවතිනු ඇත.

(අ) ශ්‍රී ලංකාවේ ශක්තිමත් විදේශ මූලයක් ලෙස පවතින්නේ කෙබඳු ප්‍රේෂණ ද?

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

[ 8 වැනි පිටුව බලන්න.

(ආ) මැදි කාලීනව සේවා අපනයන වැඩි වේගයකින් වර්ධනය වෙතැයි අපේක්ෂා කෙරෙන්නේ කවර ක්‍රියා මාර්ගයක් ඔස්සේ ද?

(ඉ) ප්‍රතිලාභ උපදවන විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අයත්වන අංශ කවරේ ද?

(ඊ) ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ සුභවාදී දැක්ම තහවුරු කෙරෙන සාධක මොනවා ද?

(උ) වෙළෙඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙන්නේ කවර ක්‍රියාමාර්ග මගින් ද?

*(ලකුණු 02 × 5 = 10 යි)*

※ ※ ※